සැ. යු.-2015.06.12 දින පළ වූ අංක 1,919 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,920 - 2015 ජුනි මස 19 වැනි සිකුරාදා - 2015.06.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1022 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1027 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජුලි මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජුනි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1019- B 80957—5,302 (2015/06)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සැම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 තනතුර (සමාගම් පරීක්ෂක) බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 තනතුරෙහි (සමාගම් පරීක්ෂක) පවතින පුරප්පාඩු03 ක් පිරවීම සඳහා අංක 02 හි සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව, ලබා ගත් මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් සුදුසු අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම් :

2.1 අධ්‍යාපන සුදුසුකම්

(i) (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) භාෂාව සහ ගණිතය ඇතුළු විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වීම;

*හා*

(ii) අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවම වශයෙන් එක් විෂයකින් හෝ සමත්ව තිබීම.
සැ. යු.— තනතුරට අදාලව පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

2.2 කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.3 වෙනත්

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 තනතුර (සමාගම් පරීක්ෂක) සඳහා බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණත්වය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරින් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද මෙම පත්වීම යටත්වේ.

4. වයස් සීමාව :

අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට වැඩි නොවිය යුතුය.

5. වැටුප් පරිමාණය :

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි MN-1-2006A අනුව රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 වේ.

6. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේදීම පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුක පරීක්ෂණය සඳහා වන සවිස්තරාත්මක ලකුණු ලබා දීමේ ක්‍රමය පහත දක්වා ඇත.

| *නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 45 |
| තනතුරින් ලබා ඇති පළපුරුද්ද (උසාවි වැඩ කටයුතු, නඩු පැවරීම සහ පරීක්ෂණය පැවැත්වීම පිළිබඳ සාමාන්‍ය අවබෝධය) | 30 |
| පරිඝණක හැකියාව | 10 |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 10 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 |
| මුළු ලකුණු | 100 |

අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

7. අයදුම්කරන ආකාරය :

(i) අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව ඒ 4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ඒ 4 පත්‍රයේ දෙපසම පාවිච්චි කර යුතු

අතර අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1 සිට 5 දක්වා පළමු පිටුවට ද, ඉතිරිය දෙවන හා තෙවන පිටුවට ද, ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතු ය.

(ii) අයදුම්කරු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිළියෙල විය යුතු ය.

(iii) සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 ලිපිනයට 2015 ජූලි මස 19 වැනි දා හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස කෙලවරේ, ''(සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් පරීක්ෂන තනතුර සඳහා බඳවා ගැනීම)'' යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක, විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්වයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස් වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්-වරයෙකු /ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 2,75,220 ට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත. තැපෑලේ දී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(vii) මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම් අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8. අයදුම්කරුගේ අනන්‍යතාවය ඃ

දැනුම්දීමක් කළ විට අයදුම්කරුවන් පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත/වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) උප්පැන්න සහතිකය.

සැ. යු ඃ-

(i) තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ වෙනත් සුදුසුකම් පිළිගත හැකි සහතික මඟින් සනාථ කළ යුතු ය.
(ii) අයදුම්පත සමග කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.
(iii) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

9. සාවද්‍ය තොරතුරු සැපයීම :—

ඉල්ලුම්පත්‍ර පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේ ය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් සතුවේ.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාල වේ.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නියමය පරිදි,

2015 ජුනි මස 19 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටු කිරීම්),
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 තනතුර (සමාගම් පරීක්ෂක) බඳවා ගැනීම සඳහා අයදුම්පත**

01. 1.1 මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 දුරකථන අංකය :————.

03. 3.1 උපන් දිනය ඃ
වර්ෂය :————. මාසය :————. දිනය :————.

3.2 2015.07.19 දිනට වයස ඃ
අවු :————. මාස :————. දින :————.

04. 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐

4.2 විවාහක/අවිවාහක බව :————.

05. 5.1 ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :—————.
(පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන්ද යන වග සඳහන් කරන්න)
5.2 ජාතිය :—————.
5.3 ජාතික හැඳුනුම්පත් අංකය :—————.

06. 6.1 අධ්‍යාපන සුදුසුකම් :

| අ.පො.ස. (සා. පෙළ) විෂයයන් | විභාග අංකය | වර්ෂය |
|---|---|---|
| | | |

| අ.පො.ස. (උ. පෙළ) විෂයයන් | විභාග අංකය | වර්ෂය |
|---|---|---|
| | | |

උපාධිධාරියෙකු නම් පහත සඳහන් විස්තර සපයන්න.

(i) උපාධිය :—————.
(ii) වර්ෂය :—————.

6.2 වෙනත් සුදුසුකම් (පරිඝණක හැකියාව ආදී)

6.3 2015.07.19 දිනට වෘත්තීය පළපුරුද්ද :

අවු :————. මාස :————. දිනය :————.

6.4 ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම :

කියවීම :- ඉතා හොඳයි/හොඳයි/සාමාන්‍ය/දුර්වලයි
ලිවීම : ඉතා හොඳයි/හොඳයි/සාමාන්‍ය/දුර්වලයි
කථා කිරීම : ඉතා හොඳයි/හොඳයි/සාමාන්‍ය/දුර්වලයි

07. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමට කැමති භාෂා මාධ්‍ය : සිංහල/දෙමළ/ඉංග්‍රීසි

08. රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ හෝ ධූරය හැර ගිය අයෙකු ලෙස සලකනු ලැබූ කෙනෙක්ද යන වග :—————.

09. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේද? :——————.

10.1 කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ ද ? :——————.

10.2 පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ විස්තර :—————.

10. අයදුම්කරුගේ සහතිකය :

ගැසට් නිවේදනයේ සඳහන් සියළුම නීති රෙගුලාසි ප්‍රකාරව මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට මා සුදුස්සෙකු වන බවත්, මෙහි සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් ප්‍රකාශ කරමි. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පටිපාටිය අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත්, සම්මුඛ පරීක්ෂණයට පෙර එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ (7) IV පරිදි විය යුතුය.)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ............ වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේදී තැබූ බවත් මම සහතික කරමි.

—————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :—————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

(මෙම කොටස අදාල වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට පමණි)

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ........... මයා/මිය/මෙය ........... තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳ කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
හෝ බලය පැවරුණු නිලධාරියාගේ
අත්සන (නිල මුද්‍රාව)

දිනය :—————.

06-455

---

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

### රියදුරු තනතුර සඳහා බඳවා ගැනීම

1. පොදු සුදුසුකම් :
   1.1 විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
   1.2 උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
   1.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට වයස අවු. 18ට නොඩු සහ 45ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

1.4 තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටුකිරීමට හා සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

2. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

මෙම තනතුර ස්ථිරය. පත්වීම ලැබූ දින සිට අවු. 03ක පරිවාස කාලයකට යටත් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ. රජය විසින් පනවනු ලැබූ පොදු නීති, කොන්දේසි සහ නියමයන්ට යටත් ය. සේවා අවශ්‍යතාව මත විධිමත් ක්‍රමවේදයන් අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

3. *තනතුරු නාමය* : රියදුරු III ශ්‍රේණිය

4. *වැටුප් ප්‍රමාණය* :
PL 3-2006A-(රු. 12,670-10x130-10x145-10x160-12x170-රු. 19,060)

5. *සුදුසුකම්* :

5.1 අධ්‍යාපන—
අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙන් විෂයන් දෙකක් සමත්ව තිබිය යුතුය.

5.2 ශිල්පීය/නිපුණතා/ප්‍රවීණතා—
මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල බී. සී. ඩී. කාණ්ඩයේ වලංගු මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. මෝටර් රථ රියදුරන් රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද ලබා තිබිය යුතුය.

6. ඉල්ලුම් කළයුතු ආකාරය :
දැනටමත් රාජ්‍ය/අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම් පත ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2015.07.17 දින වේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. අයදුම්කරුවන් මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කොට 2015.07.17 දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, අංක 126, නාවල පාර, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''රියදුරු තනතුර සඳහා'' යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම අනුව ඇබෑර්තු පිරවීම, නොපිරවීමට සම්පූර්ණ බලතල ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිට ඇත.

මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක,
සභාපති.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව,
අංක 126, නාවල පාර, නුගේගොඩ.

ආදර්ශ අයදුම්පත්‍රය

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ රියදුරු තනතුර සඳහා අයදුම් පත්‍රය**

(1) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(ii) මුලකුරු සමඟ නම :————.

(2) ස්ථිර ලිපිනය :————.

(3) දුරකථන අංකය : නිවස | | | | | | | | | | |
ජංගම | | | | | | | | | | |

(4) ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

(5) උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

අයදුම්පත් භාරගන්නා දිනට වයස : අවු. | | | මාස | | | දින | | |

(6) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

(7) ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින්ද ලියාපදිංචියෙන්ද යන වග :————.

(8) අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (උ. පෙළ) ප්‍රතිඵල :

| *විෂය* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(ii) අ. පො. ස. (සා. පෙළ.) ප්‍රතිඵල :

| *විෂය* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(9) ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :————.

(10) වෘත්තීය සුදුසුකම් :————.

(11) සේවා පළපුරුද්ද :————.

(12) අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති සියලු තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ

පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීම ඇතුළු දඬුවම්වලට යටත්වන බව මම දනිමි.

________,
අයදුම්කරුගේ අත්සන.

දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

............................මහතා දැනට මෙම ආයතනයේ ........... වශයෙන් සේවය කරයි. ඔහු ඉහත දන්වා ඇති තොරතුරු නිවැරදි වන අතර ඉල්ලුම් කරන තනතුර සඳහා ඔහු තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු කුමන ආකාරයෙන් හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැත. මෙම අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

________,
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

06-534

---

## නීතිපති දෙපාර්තමේන්තුව

### නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් මුරකරු තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

බදුල්ල, අනුරාධපුර, මොණරාගල, අම්පාර, නුවරඑළිය, ඇඹිලිපිටිය සහ මහනුවර යන දිස්ත්‍රික්කවල පිහිටා ඇති නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ නිල නිවාසවල පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ මුරකරු තනතුර සඳහා පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (ඉහත දිස්ත්‍රික්කවල පදිංචි අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

*තනතුරේ ස්වභාවය :*

ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

*තනතුරට අදාල වැටුප් ක්‍රමය :*

මසකට : රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 ක වැටුප් පරිමාණයක් මෙම තනතුරට අදාල වේ.

*සුදුසුකම් :*

1. *අධ්‍යාපන සුදුසුකම් :*

   අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් විය යුතු ය.

2. *වෘත්තීය සුදුසුකම් :*

   ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

3. *පළපුරුද්ද :*

   ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

4. *කායික සුදුසුකම් :*

   සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

5. *වෙනත් සුදුසුකම් :*

   (i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
   (ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
   (iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණකර තිබිය යුතු ය.

6. *වයස :*

වයස අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුයි.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් කුසලතා අනුපිළිවෙලින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවාගනු ලැබේ.

අයදුම්පත් මේ සමග ඇති ආකෘතියට අනුව සකස් කර නිසි ලෙස සම්පූර්ණ කර ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "මුරකරු තනතුර සඳහා අයදුම්පත" ලෙස සඳහන් කර 2015.07.17 දිනට පෙර නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතු ය.

වයි. ජේ. ඩබ්ලිව්. විජයතිලක,
නීතිපති.

### නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් මුරකරු තනතුර සඳහා අයදුම්පත

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. මුලකුරු සමග නම :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————.
4. ස්ථිර ලිපිනය :————.
5. දුරකථන අංකය :————.
6. උපන් දිනය :————.
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

   අවු. :————. මාස :————. දින :————.

8. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සා. පෙ.)

වර්ෂය :———. විභාග අංකය :———.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. ……………… | ……………… |
| 2. ……………… | ……………… |
| 3. ……………… | ……………… |
| 4. ……………… | ……………… |
| 5. ……………… | ……………… |
| 6. ……………… | ……………… |
| 7. ……………… | ……………… |
| 8. ……………… | ……………… |
| 9. ……………… | ……………… |
| 10. ……………… | ……………… |

අ. පො. ස. (උ. පෙ)

වර්ෂය :———. විභාග අංකය :———.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. ……………… | ……………… |
| 2. ……………… | ……………… |
| 3. ……………… | ……………… |
| 4. ……………… | ……………… |

9. වෘත්තීය සුදුසුකම් : (අදාල සහතිකවල ඡායා පිටපත් අමුණන්න.)

10. සේවා පළපුරුද්ද : (අදාල සහතිකවල ඡායා පිටපත් අමුණන්න)

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.

———,
අයදුම්කරුගේ අත්සන

දිනය :———.

06-428

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

03. මෙම තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ඒ - (MN-3) අනුව රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - 27,885 ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අයදුම්කරුවන් පහත සඳහන් සියලුම මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ.

*අධ්‍යාපන සුදුසුකම් :*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම;

සහ

සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ. පො. ස. (උ. පෙළ) විභාගය සමත්වීම.

*වෘත්තීය සුදුසුකම් :*

සිවිල් ක්ෂේත්‍රයට අදාලව පහත සඳහන් එක් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම. :-

(i) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්)

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්)

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

06. *අයදුම්කළ යුතු ක්‍රමය* :

(අ) මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ 4 (21cm x 29cm) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අංක 1 සිට 6 දක්වා ඡේද මුල් පිටුවට ඇතුළත් වන පරිදි අයදුම්පත් පිළියෙල කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

(ආ) අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(ඇ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015.07.20 දින හෝ ඊට ප්‍රථම "අධ්‍යක්ෂ ජනරාල්" අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 1095, නුවර පාර, පේරාදෙනිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ කාර්මික නිලධාරි (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2015" ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඈ) ලංකා බැංකුවේ "පේරාදෙනිය ශාඛාවේ අංක 7042612" දරන ගිණුමට බැර වන ලෙස විභාග ගාස්තු වශයෙන් රුපියල් 500 ක් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා යන්ත්‍ර මුද්‍රාව සහිත මුදල් බැඳීමේ කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පතේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඉ) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර, සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් පිළිබඳව දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඊ) රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ නීතිඥයෙකු හෝ රජයේ සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියෙකු විසින් අයදුම්පත්‍රයේ අපේක්ෂකයන්/අපේක්ෂිකාවන්ගේ අත්සන සහතික කළ යුතුය.

(උ) දැනටමත් රජයේ සේවයේ නියුතුවූවන් තම ආයතන ප්‍රධානියා මගින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

07. *විභාග පරිපාටිය* :

(අ) මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබේ.

(ආ) අයදුම්පත්‍ර එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ඇ) විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඈ) *අනන්‍යතාවය* :- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා—

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, හෝ
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය, හෝ පිළිගැනේ.

තම අනන්‍යතාවය තහවුරු කිරීමට අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ඉ) විෂය නිර්දේශය :

| *විෂය අංකය* | *විෂයය* | *කාලය පැය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01. | බුද්ධි පරීක්ෂණය | 1 | 100 | 40% |
| 02. | පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | 3 | 100 | 40% |

(i) බුද්ධි පරීක්ෂණය :
අපේක්ෂකයාගේ, තර්කානුකූලව හා විශ්ලේෂනාත්මකව සිතීමේ හැකියාවත් තීරණ ගැනීමේ ශක්තියත් නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ii) පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය):
* මැනීම හා මට්ටම් ගැනීම පිළිබඳ දැනුම,
* ගොඩනැගිලි ද්‍රව්‍ය යොදා ගනු ලබන ආකාරය හා ප්‍රමිතිය පිළිබඳ දැනුම,
* අත්තිවාරම්, බිත්ති බැඳීම, දැව වහලය, යකඩ තාප්ප, කුළුණු කොන්ක්‍රීට් තලාද හා කොන්ක්‍රීට් කුළුණු, අත්තිවාරම් තට්ටු, තරප්පු ආදිය යොදනු ලබන ආකාරය හා යොදනු ලබන අවස්ථා,
* ගොඩනැගිලි ඉදිකිරීම් හා ඇස්තමේන්තු පිළියෙල කිරීම,
* අදාළ ඇස්තමේන්තු හා ඉදිකිරීම් සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රමාණයන් හා කම්කරු ශ්‍රමය ඇස්තමේන්තු කිරීම,
* ව්‍යුහ නම්‍යතා/ව්‍යාකෘති බල සටහන,
* විදුලි, ජල, සනීපාරක්ෂක සේවා පිළිබඳ දැනුම.

(ඊ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) තෝරාගනු ලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් දිවයිනේ කවර ප්‍රදේශයක දී වුවද, සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ii) මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස සේවා කාලයකට යටත් වනු ඇත.

09. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත තරඟ විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනු පිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේදී ලබා ගත් මුළු ලකුණුවල කුසලතා අනු පිළිවෙළ මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල ලේඛනය අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දීමෙන් අනතුරුව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තමා විභාගයේ දී එක් එක් විෂයයට ලබා ගත් ලකුණු හා මුළු ලකුණු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලික ලබාදීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ඇත.

10. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුරට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් පත්වීම් ලැබීමට නුසුදුස්සෙකු සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

11. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම දැන්වීමෙහි සඳහන් විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

12. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි, යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. විභාගය පැවැත්වීම ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එන්. කේ. ඒ. රූපසිංහ,
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2015

Application for the Competitive Examination for Recruitment to the post of Technical Officer (Civil) of Class III of the Sri Lanka Technological Service in the Department of Export Agriculture - 2015

විභාගයට පෙනී සිටින
භාෂා මාධ්‍යය : සිංහල 2
දෙමළ 3
ඉංග්‍රීසි 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. නම
1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA. A. B.

1.2 සම්පූර්ණ නම :———.
(සිංහලෙන්/දෙමළෙන්)

02. ස්ථිර ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.1 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 දුරකථන අංකය : ජංගම
(ඇත්නම්) ස්ථාවර

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී 1 පුරුෂ 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. විවාහක/අවිවාහක බව :
විවාහක - 2 අවිවාහක - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත අංකය :

06. 6.1 උපන් දිනය වර්ෂය මාසය දිනය

6.2 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :

අවු. : මාස : දින :

07. *අධ්‍යාපන සුදුසුකම් :*
*(අ) අ.පො.ස. (සා. පෙළ) :*
වර්ෂය හා මාසය :———.
විභාග අංකය :———.
භාෂා මාධ්‍යය :———.

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6 | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9 | | |
| 5. | | | 10. | | |

*(ආ)* අ.පො.ස. (උ. පෙළ) :
වර්ෂය හා මාසය :———.
විභාග අංකය :———.
භාෂා මාධ්‍යය :———.

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

(*ඇ*) *වෘත්තීය සුදුසුකම් :-*

| ඩිප්ලෝමාව සහ ආයතනයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|---|
| | | |
| | | |

09. (*අ*)

| | |
|---|---|
| විභාග ගාස්තු ගෙවූ දිනය | |
| මුදල් ගෙවූ බැංකු ශාඛාව | |
| ගෙවන ලද මුදල | |

විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. (කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

10. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

තව ද, මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වෙමි.

———,
අයදුම්කරුගේ අත්සන

දිනය :———.

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .........යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ......... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

———,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :———.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12. *අයදුම්කරු රජයේ සේවයේ නියුක්තවූවෙක් නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

ඉහත තොරතුරු සඳහන්............. මයා/මිය/මෙනවිය ................. අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ සේවය කරන බව ද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :———.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.

(නිල මුද්‍රාව)

06-504

---

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

### ප්‍රවාහන නිලධාරි (III ශ්‍රේණිය) තනතුරට සහ කාර්මික නිලධාරි (III ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරි තනතුරු එකක් (01) සහ කාර්මික නිලධාරි තනතුරු එකක් (01) සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාර මි. මී. 297 x මි. මී. 210 (A4) කඩදාසිවල පිළියෙල කරගත් අයදුම්පත් 2015.07.27 දින හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 02, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 34 දරන ස්ථානයේ සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල් යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ප්‍රවාහන නිලධාරි/කාර්මික නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය.

අයදුම්පත්‍රය නිවේදනයේ ප්‍රකාර සෑම ආකාරයෙන් ම සම්පූර්ණ හා නිවැරදි විය යුතු අතර, එසේ නොවන හෝ නියමිත දිනට නොලැබෙන ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් හෝ ඒ සම්බන්ධ ලිපි හෝ තැපෑලේ දී නැති වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

01. *තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය :*

1.1 ප්‍රවාහන නිලධාරි

දෙපාර්තමේන්තුවේ වාහන යාවත්කාලීනව පවත්වාගෙන යාම හා මෙම තනතුරට අදාළව පැවරෙන අනෙකුත් අධීක්ෂණ කාර්යයන්.

1.2 කාර්මික නිලධාරි

දෙපාර්තමේන්තුවේ සියලුම ඉදිකිරීම් වැඩ සම්බන්ධ කටයුතුවල දී වැඩ සැලසුම් කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම, ක්ෂේත්‍රයේ සිටිමින් වැඩ පරීක්ෂා කිරීම තුළින් එකී කාර්යයන් නියමිත ප්‍රමිතියට අනුව සිදු වන්නේ ද යන්න පරීක්ෂා කිරීම, ඒ සම්බන්ධ සැලසුම් සකස් කිරීම, සටහන් තබා ගැනීම හා මෙම තනතුරට අදාළව පැවරෙන අනෙකුත් අධීක්ෂණ කාර්යයන්.

02. *වැටුප් පරිමාණය :*

වාර්ෂිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 අයත් වේ. (රා.ප.ච. 6/2006 iv ට අනුව (MN-3-2006-A)

(කාර්යක්ෂමතා කඩඉම ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව වේ.)

03. *වයස් සීමාව :*

අයදුම්කරුවන් 2015.07.27 වැනි දිනට වයස 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

4.1 ප්‍රවාහන නිලධාරි (III ශ්‍රේණිය)

(අ) *අධ්‍යාපන සුදුසුකම් :*

විද්‍යා විෂයයන් තුනක් (03) සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) *වෘත්තීය සුදුසුකම් :*

(i) ජාතික ආධුනිකත්ව පුහුණු කිරීමේ අධිකාරියේ ඔරුගොඩවත්ත පුහුණු මධ්‍යස්ථානයේ මෝටර් කාර්මික විද්‍යාව හෝ මෝටර් රථ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව වසර 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;

*හෝ*

(ii) ජර්මන් කාර්මික විද්‍යාලයේ මෝටර් කාර්මික විද්‍යාව හෝ මෝටර් රථ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව වසර 03කට නොඅඩු පාඨමාලාවක හදාරා සහතිකයක් ලබා තිබීම;

*හෝ*

(iii) පිළිගත් රජයේ ආයතනයකින් ලබාගත් මෝටර් කාර්මික විද්‍යාව හෝ මෝටර් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා එය සාර්ථක අන්දමින් සම්පූර්ණ කර තිබීම;

*හා*

(iv) සියලුම වර්ගයේ මෝටර් කාර් හා ලොරි පැදවීම පිළිබඳ, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු ප්‍රවීණත්ව සහතිකයක් හා මෝටර් වාහන අළුත් වැඩියා කරනු ලබන "ඒ" පන්තියේ වැඩ පලක් භාරව කටයුතු කර ඇති බවට පිළිගත් ආයතනයකින් සහතිකයක් ලබා තිබීම;

*හා*

(v) කම්කරුවන් සංවිධානය කිරීම හා පාලනය කිරීම ද, රථ වාහන සමූහයකින් සමන්විත රියගාලක් නඩත්තු කිරීම සතු ප්‍රවාහන සංචිතයක සේවකයන් පාලනය කිරීම ආදී හැකියාවක් තිබීම;

*හා*

(vi) ප්‍රෙටල් හා ඩීසල් ඇතුළත දවන (Internal Combusion ) පෙට්‍රල් හා ඩීසල් එන්ජින් අළුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ දැනුමක් ද තිබීම.

4.2 කාර්මික නිලධාරි (III ශ්‍රේණිය)

(අ) අධ්‍යාපන සුදුසුකම් :

ශුද්ධ ගණිතය/ව්‍යවහාර ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයයන් තුනකින් (03) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වීම;

*සහ*

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව එකවර විෂයයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

(i) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය මගින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

(ඇ) පළපුරුද්ද :

අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පලපුරද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඇ) කායික සුදුසුකම් :

(i) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) 2015.07.27 දිනට ඉහත 3 සහ 4 හි දක්වා ඇති සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

05. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත තරඟ විභාගයකට සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ලිඛිත විභාගය පිළිබඳ විස්තර :

බුද්ධි පරීක්ෂණය - පැය 1 1/2 (ලකුණු 100)

විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය - පැය 03 (ලකුණු 100)

අපේක්‍ෂකයන්ට සිය මනාපය අනුව එක් භාෂා මාධ්‍යකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැක.

විෂය නිර්දේශය :

ප්‍රවාහන නිලධාරි (III ශ්‍රේණිය)

| | | |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය | - | විද්‍යාගත සංඛ්‍යාත්මක හා රූපකාර සංදර්ශනයන් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් හා ප්‍රතිචාරයන් පරීක්‍ෂා කිරීම තුලින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්‍ෂා කෙරේ. |
| තාක්‍ෂණ ප්‍රශ්න පත්‍රය | - | මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව හා මහා මාර්ග නීති පිළිබඳ දැනුම මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්‍ෂා කෙරේ. |

කාර්මික නිලධාරි (III ශ්‍රේණිය)

| | | |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය | - | අපේක්‍ෂකයාගේ සිතීමේ තර්කානු-කූලතාවත් , සිතීමේ විශ්ලේෂණ තත්වය තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්ණ වලින් යුක්තය. |
| තාක්‍ෂණ ප්‍රශ්න පත්‍රය | - | ගොඩනැගිලි ඉදිකිරීම, තීන්ත ආලේප කිරීම, දැව වර්ගීකරණය, දැව පදම් කිරීම, සපයන ලද දළ සටහන් අනුව වැඩ සඳහා සැලසුම් පිළියෙල කිරීම, ප්‍රමාණ පත්‍රවලට අනුකූලව බිල්පත් සෑදීම සහ මූලික ජල සම්පාදන හා ජල ප්‍රවාහනය පිළිබඳ දැනුම |

06 *විභාග ගාස්තු :*

අයදුම්කරුවන් රු. 500 ක විභාග ගාස්තු ගෙවිය යුතු වේ. එම මුදල සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ අංක 0007041628 දරන ගිණුමට බැර වන පරිදි ඕනෑම බැංකු ශාඛාවක් වෙත ගෙවා ලබාගත් බැංකු රිසිට්පතක් අයදුම්පත්‍රය සමග එවිය යුතුය. රිසිට්පතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීමට උපදෙස් දෙනු ලැබේ. මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ.

07. *පරිවාස කාලය :*

තෝරා ගන්නා ලද අපේක්‍ෂකයින් තුන් (03) අවුරුදු පරිවාස කාලයකට යටත් කොට එය අවසානයේ දී ඔවුන් විසින් සමත් විය යුතු යැයි නියම කරනු ලබන දෙපාර්තමේන්තු විභාග සමත් වුවහොත් තනතුරේ ස්ථිර කරනු ලැබේ.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(a) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය ;
(b) දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට නියම කළ හැකිය ;

09. *සේවා කොන්දේසි :*

(a) රාජ්‍ය භාෂා නීතිය හා රජය විසින් වරින් වර පනවනු ලබන සියලුම රෙගුලාසි, නීති අනුව ක්‍රියාත්මක කිරීමට බැඳී සිටිය යුතු ය ;
(b) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 -12 දක්වා වගන්ති අදාළ වේ.
(c) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් විධි විධාන සහ කොන්දේසිද අදාළ වේ.

එල්. කේ. ජී. ගුණවර්ධන,
සුරාබදු කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
2015 ජුනි මස

### ආදර්ශ අයදුම්පත්‍රය

### *සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරී/ කාර්මික නිලධාරී තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) සම්පූර්ණ නම (මව් බසින්) :————.
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :————.
(iii) මුල්කුරු සමග නම :————.

02. (i) ස්ථිර පදිංචි ලිපිනය :————.
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
(iv) තැපැල් ලිපිනය :————.
(විභාග ප්‍රවේශපත්‍ර එවීම සඳහා)
(v) දුරකථන අංකය :————.

03. උපන් දිනය :————.
2015.07.27 වැනි දිනට වයස ඃ අවුරුදු :——. මාස :——.
දින:——.

04. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන බව (පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද, යන වග සඳහන් කරන්න) :————.

05. ජාතිය :————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :————.

07. විවාහක ද/අවිවාහක ද යන වග :————.

08. *අධ්‍යාපන සුදුසුකම් ඃ*

(i) අ.පො.ස. (සා. පෙ.) විභාගයේ සාමාර්ථයන් ඃ

*වර්ෂය* :————.

| *සමත් වූ විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(ඉහත සහතික පත්‍රයන්හි ඡායා පිටපත් සහතික කර අමුණා එවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.)

(ii) අ.පො.ස. (උ. පෙ.) විභාගයේ සාමාර්ථයන් ඃ

| *වර්ෂය* :————. | |
|---|---|
| *සමත් වූ විෂයයන්* | *සාමාර්ථය* |
| | |
| | |
| | |
| | |

(ඉහත සහතික පත්‍රයන්හි ඡායා පිටපත් සහතික කර අමුණා එවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.)

(III) වෘත්තීය සුදුසුකම් ඃ

| *පාඨමාලාවේ නම* | *පාඨමාලාව හැදෑරූ කාලය සිට - දක්වා* | *පාඨමාලාවේ වසර ගණන* | *ආයතනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ඉහත සහතික පත්‍රයන්හි ඡායා පිටපත් සහතික කර අමුණා එවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.)

(IV) පළපුරුද්ද ඃ පාඨශාලාවෙන් අස් වූ පසු කරන ලද රැකියා/හදාරන ලද පුහුණු පාඨමාලා ඃ

| *රැකියාවේ හෝ පාඨමාලාවේ නම* | *කාලය සිට - දක්වා* | *ආයතනය* | *රැකියාවක් නම් අස්වීමට හේතුව* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ඉහත සහතික පත්‍රයන්හි ඡායා පිටපත් සහතික කර අමුණා එවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.)

09. මුදල් ගෙවූ බැංකුවේ නම :————. ලදුපත් අංකය :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

10. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු එවැනි දෑ අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

06-641

---

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

ජාතික වෘත්තීය පුහුණු ආයතනය - රත්මලාන

පාඨමාලා සඳහා බඳවා ගැනීම - 2015 (දෙවන අර්ධ වර්ෂය)

| | | *මට්ටම* | *කාලය* | *මුදල* | *සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | ලියවන යන්ත්‍ර ක්‍රියාකරු<br>Lathe man | NVQ 03 | (මාස 12) | රු. 3,100 | අ. පො. ස. (සා. පෙළ) විෂයයන් 06කින් සමත් වීම |

| | | මට්ටම | කාලය | මුදල | සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 02 | පරිගණක චිත්‍රක ශිල්පී පාඨමාලාව Computer Graphics Design | NVQ 03 | (මාස 12) | රු. 10,600 | අ. පො. ස. (සා. පෙළ) ගණිතය ඉංග්‍රීසි සම්මාන සහිත විෂයන් 06කින් සමත්වීම |
| 03 | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී පාඨමාලාව Information and communication Technology Technician | NVQ 04 | (මාස 12) | රු. 8,100 | |
| 04 | ගුවන්විදුලි, රූපවාහිණී අළුත්වැඩියා කාර්මික ශිල්පී පාඨමාලාව Radio, TV & Allied Equipment Repair | NVQ 04 | (මාස 18) | රු. 5,100 | |
| 05 | පරිගණක දෘඩාංග ශිල්පී පාඨමාලාව Computer hardware Technician/ Cisco Computer hardware | NVQ 04 | (මාස 12) | රු. 12,600 | අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිත විෂයයන් 06කින් සමත්වීම |
| 06 | මෝටර් රථ පින්තාරු ශිල්පී පාඨමාලාව Automobile Painter | NVQ 04 | (මාස 12) | රු. 4,100 | |
| 07 | වඩු කාර්මික ශිල්පී පාඨමාලාව Wood machinist | NVQ 03 | (මාස 12) (රු. 2,000 මාසික දීමනාවක්) | Free | අ. පො. ස. (සා. පෙළ පෙනී සිටීම) |
| 08 | ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී පාඨමාලාව Aluminum fabricator | NVQ 03 | (මාස 12) (රු. 1,000 මාසික දීමනාවක්) | Free | |
| 09 | උද්‍යාන අලංකරණ ශිල්පී පාඨමාලාව Landscaping | Non NVQ | (මාස 12) (රු. 1,000 මාසික දීමනාවක්) | Free | |
| 10 | පෑස්සුම් ශිල්පී පාඨමාලාව Welder | NVQ 03 | (මාස 12) රු. 2000ක මාසික දීමනාවක් | Free | |
| 11 | විදුලි ශිල්පී පාඨමාලාව Electrician | NVQ 03 | (මාස 12) | Free | |

- * පාඨමාලා කාලය යනු ආයතනික සහ ප්‍රායෝගික (වැඩහල්) පුහුණු කාලයන්හි එකතුවයි.
- * අංක 06, 07, 09,10, 11 පාඨමාලා සඳහා ගාස්තු අය නොකෙරේ.
- * ඉහත සියළුම පාඨමාලා සහ මෝටර් රථ කාර්මික ශිල්පී, විදුලි කාර්මික, ශීතකරන හා වායු සමීකරණ
- * සැලසුම් ශිල්පී, මෝටර් රථ විදුලි කාර්මික පාඨමාලා සඳහා අර්ධ කාලීන සති අන්ත පාඨමාලා පැවැත්වේ.

අපෙන් ඔබට. . . .

- * ජාතික වෘත්තිය සුදුසුකම් සහතික, NVQ
- * නිපුණතා පාදක පුහුණුව
- * සියලුම පුහුණුලාභීන් සඳහා ආයතනික පුහුණුව
- * සාර්ථක පුහුණුව නිම කරන සැමට දෙස් විදෙස් රැකියා අවස්ථා
- * පුහුණු ලාභීන් (කාන්තා හා පිරිමි) සඳහා නේවාසික පහසුකම්
- * වෘත්තීය උපදේශන සේවාවන්
- * සියලුම පුහුණු ලාභීන් සඳහා වෘත්තීය ඉංග්‍රීසි දැනුම ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- * නායකත්ව පුහුණුව සහ වෘත්තීය මාර්ගෝපදේශනය
- * ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන්
- * ස්වයං රැකියා සඳහා රු. 500000 දක්වා ණය පහසුකම්

සහතිකයක් නොමැති ක්ෂේත්‍රයේ නිරත වූවන් සඳහා RPL මගින් NVQ සහතිකයක්
Trade Test එක් දින පරීක්ෂණයකින් පසු සහතිකයක් නිකුත් කිරීම (විදේශ රැකියා සඳහා)

පාඨමාලාව සඳහා යොමුවීම :

ඔබ විසින් පිළියෙල කර ගත් අයදුම්පතක් (නම, ලිපිනය, වයස, දුරකථන අංකය, අධ්‍යාපන සුදුසුකම් ඇතුළත්ව) 2015.07.10 දිනට පෙර යොමු කරන්න.

නැතහොත්,

ඔබගේ නම, ලිපිනය, කැමති පාඨමාලාව 0714446784 දුරකථන අංකයට SMS කරන්න.

(සුනිල් මයා)

විමසීම් : 011 2638850, 0719654502

අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :

නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 100,
කඳවල පාර,
රත්මලාන

06-550

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.